# මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2016

## Primary Piriven Mid Year Term Test - 2016

2 වසර / Grade 2

**සිංහල**
**Sinhala**

**කාලය : පැය දෙකයි.**
**Time : Two hours**

* **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 06 කට පිළිතුරු සපයන්න.**

01. පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරාගෙන වචන 150 කට නොඅඩු වාක්‍ය රචනයක් ලියන්න.

1. මා ගිය විනෝද චාරිකාව
2. "අවිගත්තෝ අවියෙන් ම නැසෙති"
3. "ගුණ නැණ බෙලෙන් යුතු පුතු මය ඉතා ගරු"
4. යහපත් මිතුරු ඇසුර
5. සමගිය බලය වේ. (ලකුණු - 25)

02. අ) නූතන සිංහල අක්ෂර මාලාවේ දීර්ඝ ස්වර අක්ෂර ලියා දක්වන්න. (ලකුණු - 05)

ආ) පහත සඳහන් වචන රේඵය සහ රකාරාංශය යොදා නැවත ලියන්න.

1. කර්මය 2. ධර්මය 3. චක්රය
4. මුද්රණය 5. සමුද්රය (ලකුණු - 05)

ඇ) පහත සඳහන් වචනවල හිස්තැනට සුදුසු අක්ෂරය වරහන් තුළින් තෝරා ලියන්න.

1. අධර්මි............ය (ෂ්, ශ්) 4. රක්............ණය (ෂ, ශ)
2. මර්............නය (ධ, ද) 5. ලේ ............නය (ක, ඛ)
3. කු............ටුව (නා, ණා)

(ලකුණු - 05)

03. අ) පහත දැක්වෙන වචනවල ඉරි ඇඳී අකුරුවල ස්වර ව්‍යඤ්ජන වෙන් කරන්න.

1. <u>තු</u>රුව 4. <u>පො</u>ළොව
2. <u>වි</u>කිණීම 5. <u>බෝ</u>ධිය
3. <u>හේ</u>දය (ලකුණු - 05)

ආ) පහත දැක්වෙන නාම පද ජාති, ද්‍රව්‍ය, ගුණ, ක්‍රියා, සංඥා යන වර්ග 5ට වෙන්කර ලියන්න.

1. ගුරුවරිය 2. පැන්සල 3. සංගීතය
4. ඉන්දියාව 5. ශිෂ්‍යයා 6. ගායනය
7. ලිවීම 8. ප්‍රීතිය 9. බල්ලා
10. වීණාව (ලකුණු - 05)

ඇ) පහත සඳහන් ඡේදයේ දැක්වෙන නිපාත පද 5ක් තෝරා ලියන්න.

දර කැඩීම පිණිස දියණිය සමග කැළයට ගිය මව මැල්ලුමක් සඳහා පලා කොළ ද නෙළාගෙන අඳුරට පෙර නිවසට ආවාය. (ලකුණු - 05)

04. අ) පහත සඳහන් වගුවේ සඳහන් හිස්තැන්වලට අදාළ ඒකවචන, බහුවචන ක්‍රියාරූප දක්වන්න.

| ඒකවචන | බහුවචන |
|---|---|
| ගියෙමි | ......................................... |
| ......................................... | යති |
| ගියෙහි | ......................................... |
| බබලයි | ......................................... |
| ......................................... | සැරසුනෙමු |

(ලකුණු - 05)

ආ) සුදුසු ක්‍රියාපද යොදා හිස්තැන් පුරවන්න.

1. නුඹ පුවත්පත ......................................... (කියවහි. / කියවහු.)
2. ළමයා ලස්සන චිත්‍රයක් ......................................... (අඳියි. / අඳිති.)
3. ඇය සාරියක් මිලට ......................................... (ගත්තාය. / ගත්තේය.)
4. මම පෙරහැර ......................................... (බැලුවෙමි. / බැලුවෙමු.)
5. ඔහු රූපවාහිනිය ......................................... (නරඹයි. / නරඹති.)

(ලකුණු - 05)

ඇ) උදාහරණ මගින් පූර්වක්‍රියාව පැහැදිලි කරන්න.

(ලකුණු - 05)

05. අ) "කුමර" ශබ්දය සියලු විභක්තිවල වරනගන්න.

(ලකුණු - 10)

ආ) උපසර්ග කෙටියෙන් හඳුන්වා උපසර්ග සහිත නාමපද පහක් ලියන්න.

(ලකුණු - 05)

06. සුභාෂිතයේ ඔබ කට පාඩම් කළ කවි තුනක් ලියා එහි අර්ථය ද ලියා දක්වන්න.

(ලකුණු - 15)

07. කථාමෘතයේ ඔබ මෙතෙක් උගත් කතා ඇසුරින් තම ජීවිතයට ගත හැකි ආදර්ශ මොනවාදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු - 15)

08. "රෝහිණී" ඓතිහාසික කතා පුවතක් පදනම් කරගෙන රචනා වූ නවකතාවකි. ඔබ මෙතෙක් උගත් පරිච්ඡේද ඇසුරින් මෙය සනාථ කරන්න.

(ලකුණු - 15)

The National e-learning Portal for The General Education